# 2023

## කාර්ය සාධන වාර්තාව

## Performance Report

## රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

## Department of Public Finance

**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

**Ministry of Finance, Economic Stabilization and National Policies**

**ඇමුණුම I**

## 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
## රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ අංකය: 245

අන්තර්ගතය


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම:

රටෙහි ආර්ථිකයට ක්ෂණික බලපෑම් ඇති කරන ආකාරයෙන් රාජ්‍ය සම්පත් එනම් රාජ්‍ය ආදායම සහ වියදම කළමනාකරණය කරන ආකාරය, රාජ්‍ය මුදල් කළමනාකරණය විෂය හා සම්බන්ධ වේ. සාමාජීය අවශ්‍යතා රජය සතුව පවතින සම්පත්වලට වඩා වැඩි බැවින්, ආර්ථික හානි හා අපතේ යාම් අවම වන ආකාරයෙන් සියලුම රාජ්‍ය සම්පත් හැකිතාක් කාර්යක්ෂමව හා සඵලදායීව භාවිතා කිරීම අවශ්‍ය වේ. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී රජය සහ පුරවැසියන් අතර අන්‍යොන්‍ය විශ්වාසයක් හා පොදු එකඟතාවක් ඇති කිරීමෙහි ලා කාර්යක්ෂම රාජ්‍ය මුදල් කළමනාකරණය කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කරයි. රජයේ මුදල්වල විනිවිදභාවය සහ වගවීම තහවුරු කරමින් සහ රටේ පුරවැසියන් සඳහා වඩාත් හොඳ සේවාවක් ලබා දෙමින් දිගු කාලීන ආර්ථික සාර්ථකත්වය සහතික කිරීම සඳහාත්, සීමිත සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා කිරීම සඳහාත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රමවේද, ක්‍රියාවලි සහ ආයතනවල ප්‍රතිසංස්කරණ සිදු කිරීම අවශ්‍ය වේ.

### 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

‘‘රාජ්‍ය අංශයේ විනිවිදභාවය, වගවීම, හා සේවා සැපයීම වර්ධනය කිරීම සඳහා ශක්තිමත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීති පද්ධති රාමුවක් සකස් කිරීම’’

**මෙහෙවර**

‘‘රාජ්‍ය අංශය තුල මහජන වගවීමට සහාය වන ආයතනික ක්‍රියාකාරීත්වයක් සහිත පුළුල් යහපාලන පරිසරයක් ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය පද්ධති, පරිපාටීන් සකස්කිරීම, සමාලෝචනය, සංවර්ධනය, පසුවිපරම හා යාවත්කාලීන කිරීම.’’

**අරමුණු**

1. රාජ්‍ය අංශයේ ගණුදෙනුවල විනිවිදභාවය හා වගවීම තහවුරු කිරීම පිණිස රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති, ක්‍රමපද්ධති හා පරිපාටීන් සැකසීම, සංවර්ධනය, සමාලෝචනය, පසුවිපරම සහ යාවත්කාලීන කිරීම. (උදා: මුදල් රෙගුලාසි, රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ භාවිතයන්)

2. රාජ්‍ය මූල්‍ය සම්පත් ඵලදායිව සහ කාර්යක්ෂමව උපයෝජනය කිරීම සහතික කරනු පිණිස රාජ්‍ය ගිණුම් කාරක සභාවට අවශ්‍ය සහාය ලබා දීම සහ රාජ්‍ය අංශයේ යහපාලනය ප්‍රවර්ධනය කිරීම.


3. දැනට පවතින රජයේ ගාස්තු හා අයකිරීම් කටයුතු අධීක්ෂණය, සමාලෝචනය කිරීම සහ පිරිවැය ඵලදායීතාව ඉහළ නංවන අයුරින් බදු නොවන ආදායම් ඉපැයීමේ හැකියාව පිළිබඳව සොයා බැලීම.

4. මහජන මුදල් ඵලදායිව සහ කාර්යක්ෂම ලෙස යෙදවීම සහතික කරනු පිණිස, විවිධ අරමුණු උදෙසා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු යටතේ පිහිටුවා ඇති අරමුදල් භාවිතය විධිමත් කිරීම, අරමුදල් කටයුතු සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම.

## 1.3. සංවිධාන සටහන

ආයතනික සංවිධාන ව්‍යුහය (2023.12.31 දිනට කාර්ය මණ්ඩලය)

1.4.



## 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. මුදල් රෙගුලාසි, පසුවිපරම් හා සමාලෝචන සහ අරමුදල් අංශය
2. ඉඩම් අංශය
3. ප්‍රසම්පාදන අංශය
4. ධාරිතා සංවර්ධන සහ පුහුණු අංශය
5. විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන අංශය

## 1.5 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

- අදාළ නොවේ -

## 1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

- අදාළ නොවේ -

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශයේ ආයතනවල මූල්‍ය පාලනය සඳහා පවතින විධිවිධානවලට අනුකූල වීම, විනිවිදභාවය, වගවීම හා සේවා ලබා දීම වර්ධනය කරන වඩාත් යහපත් වූ රාජ්‍ය මූල්‍ය නියාමන රාමුවක් පවත්වා ගැනීම සඳහා රාජ්‍ය අංශයේ මූල්‍ය පාලනය සම්බන්ධ මධ්‍යගත කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

ඒ අනුව, දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යයන් අතුරින් 2023 වර්ෂය තුළ ප්‍රධාන වශයෙන් පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

02. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත නීතිගත කිරීමේ වැදගත්කම මෑත කාලීන අයවැය කථා දෙකකින්ම අවධාරණය කොට ඇති අතර 2022 වසර අග භාගයේදී රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත සකස් කිරීම වේගවත් කිරීමට කඩිනම් පියවර ගන්නා ලදී. ඒ අනුව යමින්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින්, අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමඟ එක්ව, නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරුන් දෙදෙනෙකුගේ සම සභාපතිත්වයෙන් යුතුව පත් කරන ලද අධීක්ෂණ කමිටුවේ උපදේශකත්ව සහ ප්‍රතිපත්තිමය මග පෙන්වීම් යටතේ නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පතක් සම්පාදනය කිරීමට කටයුතු කරන ලදී. 2023 වසරේ මාර්තු මාසයේදී අනුමත කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම යටතේ ශ්‍රී ලංකා රජය විසින් පිළිගන්නා ලද පූර්ව වගකීම් කොන්දේසි කිහිපය අතර මෙම පනතේ අවශ්‍යතාවය අවධාරණය කොට තිබේ. එබැවින්, දැනට පවතින 2003 වසරේ අංක 03 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වගකීම් පනතේ වැදගත් අංග, රාජ්‍ය මූල්‍ය රීති ලෙස නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පතට ඇතුළත් කිරීමෙන් එකී රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වගකීම් පනත අවලංගු කිරීමට නියමිත ය. නව මූල්‍ය රීති රාමුවක් කෙටුම්පත් කිරීමට සහ යෝජිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට එකී මූල්‍ය රීති රාමුව ඇතුළත් කිරීම සඳහා 2023 මැයි මාසයේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

03. 2023 වර්ෂය තුළ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පහත චක්‍රලේඛ නිකුත් කිරීමට කටයුතු කර ඇත.

(අ) "රජයේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රණය කරනු ලබන පොදු ආකෘතිපත්‍ර සමාලෝචනය කිරීම පිළිබඳ කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් 2023.05.19 දිනැතිව නිකුත් කරන ලද අංක 02/2023 දරණ චක්‍රලේඛය

(ආ) "තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දැනට අයකරනු ලබන තක්සේරු ගාස්තු සංශෝධනය කිරීම" යන මැයෙන් 2023.05.19 දිනැතිව නිකුත් කරන ලද අංක 03/2023 දරණ චක්‍රලේඛය

04. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74 ව්‍යවස්ථාව හා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 119 ප්‍රකාරව පිහිටුවා ඇති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ 2023 වර්ෂයේ පවත්වන ලද රැස්වීම් සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී වෙමින් කාරක සභාවට අවශ්‍ය සහය ලබාදෙන ලදී. තවද රාජ්‍ය ආයතනවලට අදාළව විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන විගණන විමසුම් හා විගණන වාර්තා පිළිබඳව අවධානය යොමු කොට රාජ්‍ය මූල්‍ය කලමනාකරණයේ දුර්වලතා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඒ ඒ

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ට හා ගණන්දීමේ නිලධාරීන්ට දන්වමින් පසු විපරම් කටයුතු 2023 වර්ෂය තුළදී සිදු කර ඇත.

05. මුදල් රෙගුලාසි 124 විධිවිධාන යටතේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී ලෙස කටයුතු කළ යුතු නිලධාරීන් සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් ලෙස ද, මුදල් රෙගුලාසි 125 විධිවිධාන යටතේ ගණන් දීමේ නිලධාරී ලෙස කටයුතු කළ යුතු නිලධාරීන් සඳහා ගණන් දීමේ නිලධාරීන් ලෙස ද, ගණන් දීමේ නිලධාරීන් අතුරෙන් ආදායම් ශීර්ෂයක් හිමි ආයතන සඳහා මුදල් රෙගුලාසි 125(2) විධිවිධාන යටතේ ආදායම් ගණන් දීමේ නිලධාරීන් ලෙස ද පත් කරමින් ඊට අදාළ පත්වීම් ලිපි නිකුත් කිරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදි.

06. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් රජයේ ආයතන විසින් 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ 2 පරිච්ඡේදයේ 3 වන කොටසෙහි පාඩු හා අත්හැර දැමීම් යටතේ කටයුතු කිරීමෙන් අනතුරුව මු.රෙ.108 (3) යටතේ කපාහැරීම සඳහා භාණ්ඩාගාරය වෙත යොමු කරන ලද අවස්ථා සහ මු.රෙ.113 යටතේ අත්හැරීමට යොමු කරන ලද අවස්ථා සඳහා 2023 වර්ෂයේ ඉල්ලීම් 57 කට අදාළ භාණ්ඩාගාර අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත.

07. විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 2/92 දරණ රාජ්‍ය දූත මණ්ඩල චක්‍රලේඛයේ විධිවිධාන පරිදි රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් භාවිතා කරන ලද වාහන අපහරණය කිරීමේදී රජයට ගෙවිය යුතු තීරුබදු මුදල පිළිබඳ කටයුතු කිරීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති අතර 2023 වර්ෂයේදී විදේශ දූත මණ්ඩල විසින් අපහරණය කරන ලද වාහන 70 ක් සඳහා වූ අදායම ලෙස රු. 170,451,690.00 ක මුදලක් ශ්‍රී ලංකා රේගුව මඟින් අය කොට රාජ්‍ය ආදායමට බැර කොට ඇත.

08. විවිධ විෂයන් යටතේ ගරු අමාත්‍යවරුන් විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා ගරු මුදල් අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ලබා දීම මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව 2023 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන, රජයේ විවිධ අරමුදල්, මුදල් රෙගුලාසි හෝ රාජ්‍ය මුදල් කළමනාකරණ විෂයන්ට සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ හා නිර්දේශයන් ලබා දීම සිදු කරන ලද අතර, 2023 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල සංදේශ 471 ක් සඳහා නිරීක්ෂණද, අමාත්‍ය මණ්ඩල සංදේශ 122 ක් සඳහා නිර්දේශ ද ලබා දී ඇත.

09. ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ස්ථාවර ප්‍රසම්පාදන කමිටු (SCAPC) 25 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටු (CAPC) 35 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන සාකච්ඡා සම්මුති කමිටු (CANC) 37 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන ස්ථාවර සාකච්ඡා සම්මුති කමිටු (SCANC) 02 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන උපදේශන ප්‍රසම්පාදන කමිටු (CACPC) 20 ක් ද, ව්‍යාපෘති කමිටු (PC) සහ තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) 382 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන ටෙන්ඩර් කමිටු

(CATC) 2 ක් හා විශේෂ කමිටු 2 ක් සඳහා ද 2023 වර්ෂය තුළදී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පත් කිරීම් සිදු කර ඇත.

10. රජයේ ප්‍රතිපත්ති තීරණ අනුව රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාල කාර්යයන් තවදුරටත් විධිමත් කරමින් වර්තමානයට ගැලපෙන පරිදි, කාලානුරූපීව රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වූ විධිවිධාන යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා අවශ්‍යය මඟ පෙන්වීම් ලබා දීම ඉදිරි වර්ෂවලදී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ක්‍රියාමාර්ගයන් වේ.

ඊ.ඒ.රත්නසීල
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්



7

## 03 පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත

## මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 | | සටහන | තතය 2023 | 2022 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 97,172,000 | 84,007,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 406,639 | 153,184 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 6,755,435 | 5,929,726 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **104,334,074** | **90,089,910** | |
| | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම්** | | | | |
| - | **නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **104,334,074** | 90,089,910 | |
| - | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 608,000 | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්** | | | | |
| - | **නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **103,726,074** | **90,089,910** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 66,500,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 62,682,248 | 62,135,174 | |
| 27,625,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 19,937,470 | 20,468,243 | ඒසීඒ-2(ii) |
| 1,200,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 967,424 | 903,590 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **95,325,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **83,587,142** | **83,507,006** | |
| | **මූලධන වියදම්** | | | | |
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා | | | | |
| 1,000,000 | වැඩිදියුණු කිරීම් | 10 | 883,868 | 48,496 | |
| 6,525,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 6,523,035 | 5,786,412 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 450,000 | හැකියා වර්ධනය | 14 | 449,473 | 185,750 | |
| 80,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 11,640,606 | - | |
| **87,975,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **19,496,982** | **6,020,657** | |
| | තැන්පතු ගෙවීම් | | 406,639 | 153,184 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 4,274,588 | 3,853,452 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **4,681,227** | **4,006,636** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **107,765,351** | **93,534,300** | |
| **183,300,000** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(4,039,277)** | **(3,444,390)** | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | (4,039,277) | (3,444,390) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | - | ඒසීඒ-3 |
| | | | **(4,039,277)** | **(3,444,390)** | |

කේ.ජී. සුභානි මධුවන්ති
නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

2024/02/26

1

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2023 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 64,059,319 | 64,059,319 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 9,594,609 | 12,075,456 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **73,653,928** | **76,134,775** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 9,594,609 | 12,075,456 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 64,059,319 | 64,059,319 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **73,653,928** | **76,134,775** |

පිටු අංක 07 සිට 30 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 31 සිට 35 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 28/02/2024

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

.........................
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 27/02/24

ඊ.ඒ. රත්නසීල
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

.........................
~~ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන~~ ගණකාධිකාරි/
~~අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස්~~ (මුදල්)
නම :
දිනය : 2024/02/26

කේ.ජී. සුභානි මධුවන්ති
නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

2

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 6,064,660 | 3,518,878 |
| අග්‍රිම ලැබීම් | | 97,172,000 | 84,007,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 5,991,864 | 5,564,838 |
| තැන්පතු ලැබීම් | | 406,639 | 153,184 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | | 109,635,163 | 93,243,900 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 82,177,580 | 82,313,017 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 967,424 | 903,590 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 13,218,903 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 608,000 | - |
| අත්තිකාරම් ගෙවීම් | | 4,400,241 | 3,853,452 |
| තැන්පතු ගෙවීම් | | 406,639 | 153,184 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | | 101,778,788 | 87,223,243 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | | 7,856,376 | 6,020,657 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| මූලධන වියදම් | | 7,856,376 | 6,020,657 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | | 7,856,376 | 6,020,657 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | | (7,856,376) | (6,020,657) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | | - | - |

කේ.පී. සුභාෂිනී මධුවන්ති
නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය

2024/02/26

3

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

2024/02/26

කේ.ජී. සුභානි මධුවන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

**3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය**

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | | අදාළ නොවේ | | | |

**3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය**

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන** | 95,500,000.00 | 95,325,000.00 | 83,587,142.00 | 87.69% |
| **ප්‍රාග්ධන** | 7,800.000.00 | 87,975,000.00 | 19,496,982.00 | 22.16% |

**3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | | | අදාළ නොවේ | | | |

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 3,956,900.00 | 3,956,900.00 | | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 31,902,419.28 | 31,902,419.28 | | 100% |
| 9153 | ඉඩම් | - | - | | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | 28,200,000.00 | 28,200,000.00 | | 100% |
| | | **64,059,319.28** | **64,059,319.28** | | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

(19)

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. TPD/E/DPF/2/23/02

ඔබේ අංකය / உமது இல. / Your No.

RECEIVED 28 MAY 2024 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

දිනය / திகதி / Date 2024 මැයි 28 දින

ගණන්දීමේ නිලධාරී

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

**ශීර්ෂය - 245 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය - 245 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துாவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් තොරතුරු අනුව 2023 වර්ෂය සඳහා සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිම එකතුව රු.100,290,000 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.117,540,000 ක් ඉල්ලුම්කර තිබුණි. ඒ අනුව, එකතුව රු.17,250,000 ක් හෙවත් සියයට 17 ක් සැලසුම් කළ අග්‍රිමයට වඩා වැඩියෙන් ඉල්ලුම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

### 2.2 වියදම් කළමනාකරණය

**පහත කරුණු නිරීක්ෂණය කෙරේ.**

(අ) වැය විෂයයන් 02 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එකතුව රු.1,150,000 ක ප්‍රමාණයක් සියයට 50 සිට සියයට 567 දක්වා පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරු කිරීම් මඟින් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි.

(ආ) වැය විෂයය අංක 245-1-1-0-1002 සඳහා වූ මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය උපයෝජනය නොවීම හේතුවෙන් රු.1,175,000 ක් හෙවත් මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 11 කින් මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරු කිරීම් මඟින් ප්‍රතිපාදන අඩුකර තිබුණි.

(ඇ) සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට වැය විෂයයන් 11 ක් සඳහා 2023 වර්ෂයේදී වෙන් කරන ලද රු.106,525,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.76,454,182 ක් උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී පැවතුණි. එය එම වැය විෂයයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 85 ක සැලකිය යුතු පරාසයක් ගෙන තිබුණි.

### 2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

(අ) 2022 දෙසැම්බර් 31දින විශ්‍රාම ගිය නිලධාරිනියකගේ ආපදා ණය රු.201,848 ක් සහ දේපල ණය රු.114,880 ක් වූ එකතුව රු.316,728 ක ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නිරවුල් වී නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අරමුදල් 13 ක් වසා දැමීමට නිර්දේශ කර තිබුණ ද, ඉන් අරමුදල් 10 ක පැවති රු.1,769,698,149 ක මුදලක් භාණ්ඩාගාරය වෙත ලබා ගැනීමෙන් පසු එම අරමුදල් වසා දමා තිබුණු නමුත් අනෙකුත් අරමුදල් 3 සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2015 අයවැය යෝජනාවක් මත ආරම්භ කෙරුණු රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත කෙටුම්පත් කර සම්මත කර ගැනීමේ කාර්යයන් 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිම වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.1.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරේ.

රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථිත්ව මිල සැඳහුම් ක්‍රමයට ප්‍රසම්පාදනය කිරීමේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කළ යුතු බව දක්වා තිබුණ ද දෙපාර්තමේන්තුව විසින් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර 2023 වර්ෂයේදී අවස්ථා 10 දී එකතුව රු.1,376,086 ක් වූ ප්‍රසම්පාදන අයිතමයන් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතයෙන් තොරව මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.

4. **මානව සම්පත් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 80 ක් වූ අතර, ඉන් තනතුරු 19 ක් පුරප්පාඩුව පැවතුණි. ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 11 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 06 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් ද විය.

බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

**04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක**

**ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| **විශේෂිත දර්ශක** | **අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම** | | |
|---|---|---|---|
| | **100%- 90%** | **75%-89%** | **50%- 74%** |
| උපදෙස් ලබා දීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ නිකුත් කිරීම | √ | | |
| දෙපාර්තමේන්තුව වෙත යොමු කළ පැහැදිලි කිරීම් සඳහා පිළිතුරු සැපයීම | √ | | |
| සහභාගී වූ රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම් සංඛ්‍යාව | √ | | |
| ගිණුම්කාරක සභාවේ මහ පෙන්වීම් පසු විපරම් කිරීම | √ | | |
| භාණ්ඩාගාර සටහන් නිකුත් කිරීම | √ | | |
| විගණකාධිපති වාර්තා නිරීක්ෂණ සම්බන්ධව පසු විපරම් කටයුතු | √ | | |
| රජයේ ගාස්තු හා අයකිරීම් සංශෝධනය | √ | | |
| පාඩු හා කපා හැරීම් සඳහා වන ඉල්ලීම් සඳහා නිර්දේශ සැපයීම | √ | | |
| රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් භාවිතා කරන ලද වාහන අපහරණය | √ | | |
| අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම | √ | | |
| ප්‍රසම්පාදන කමිටු ,තාක්ෂණික ඇගයීම් | √ | | |

| | | | |
|---|---|---|---|
| කමිටු හා ව්‍යාපෘති කමිටු පත් කිරීම | | | |
| මූල්‍ය ප්‍රකාශන, වාර්තා නියමිත කාල පරිච්ඡේදය තුළ ඉදිරිපත් කිරීම | √ | | |

**05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

**5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.**

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%- 100% |
| (08) සියල්ලන් සඳහාම පෝෂිත, සර්වග්‍රාහී හා තිරසරාත්මක ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායී රැකියා සහ සැමට යහපත් ජීවනෝපායක් ප්‍රවර්ධනය කිරීම | සංවර්ධනය ඉලක්ක කරගත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දිරිගැන්වීම | රාජ්‍ය මූල්‍ය කළමණාකරණය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සඳහා වන චක්‍රලේඛ, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වන අතිරේක සහ අවශ්‍ය උපදෙස් නිකුත් කිරිම | | | √ |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශයේ මූල්‍ය පාලනය සම්බන්ධ මධ්‍යගත කාර්ය භාරයක් ඉටු කරන අතර රාජ්‍ය අංශයේ විනිවිද භාවය වගවීම හා සේවා ලබාදීම වර්ධනය කරන වඩාත් යහපත් වූ රාජ්‍ය මූල්‍ය නියාමන රාමුවක් පවත්වාගෙන යෑමේ වගකීම පවතී. විනිවිද භාවය හා වගවීම ඉලක්ක කර ගන්නා අතර  දරිද්‍රතාවය පිටු දැකීම උදෙසා රාජ්‍ය සම්පත් කළමනාකරණය වැඩි කිරීම පිණිස දෙපාර්තමේන්තුව වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධ වී කටයුතු කරනු ලබයි. පාර්ලිමේන්තුව වැනි ආයතනවලට රාජ්‍ය වගවීම් පිළිබඳව සහාය වෙමින් නීතියේ පාලනය පිළිබඳව ක්‍රියා මාර්ග ප්‍රවර්ධනය කරමින් තිරසාර සංවර්ධන අභිමථාර්ත සාක්ෂාත් කර ගැනීමට රාජ්‍ය ආයතනවල නීත්‍යානුකූල භාවය හා විශ්වසනීයත්වය ඇති කරවමින් රාජ්‍ය අංශයේ මෙහෙයුම් සිදුවන පුළුල් පාලන පරිසරය ශක්තිමත් කිරීමද දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව මෙම වගකීම් මුදුන් පත් කර ගැනීමේදී රාජ්‍ය අංශයේ ආයතන සඳහා වන නියාමනයන් හා රාජ්‍ය මූල්‍ය උපදේශාත්මක සේවාව සපයනු ලබයි.

# 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 30 | 19 | 11 |
| තෘතීයික | 02 | 02 | 00 |
| ද්විතියික | 32 | 26 | 06 |
| ප්‍රාථමික | 16 | 14 | 02 |

## 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

කිසියම් ආයතනයක් සතු මානව සම්පත මනා කළමණාකාරිත්වයක් යටතේ පාලනය කළ විට ආයතනයෙ අරමුණු හා අභිමතාර්ථයන් කරා ළඟා වීම අපහසු කරුණක් නොවේ. ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමෙහි දී ඵලදායී මානව සම්පත දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි බලපානු ලබන සාධකයකි. කෙසේ වුවද පවත්නා මානව සම්පත කළමණාකරනය කරගනිමින් දෙපාර්තමේන්තුවේ අරමුණු හා අභිමතාර්ථයන් සඵල කරගැනීමෙහි ලා උපරිම ප්‍රයත්න දරා ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| Name of the program | No. of Staff trained | Duration of the Program | Total Investment | | Nature of the Program ( Foreign/ Local ) | Output/ Knowledge gained |
|---|---|---|---|---|---|---|
| | | | Local | Foreign | | |
| **Roles and Responsibilities of Public Procurement Policy & Implementation** | | | | | | |
| Emergency Procurement Guide line – Special Preference Heath Sector | All Treasury Representatives | 02 hour | | - | Local | - |
| Introduction to the Procurement Guidelines on Selection and Employment of Consultant (2007) and Responsibility of the Consultancy Procurement Committee Members | All Treasury Representatives | 02 hour | | | Local | |
| Variation order and Extension of time | All Treasury Representatives | 02 hour | | | Local | |
| Selection Process and Selection Methods of Consultancy Organizations | All Treasury Representatives | 2.5 hours | | | Local | |
| Selection Process and Selection of Individual Consultants. Experience Sharing Session | | | | | | |
| Guideline for Procurement of Pharmaceuticals & Medical Devices | All Treasury Representatives | 02 hour | | | Local | |
| Guideline for Procurement of Pharmaceuticals & Medical Devices (Experience Sharing Session) | All Treasury Representatives | 02 hour | | | Local | |
| Preparation of Request for Proposals (RFP) | All Treasury Representatives | 02 hour | | | Local | |
| Evaluation of Consultancy Procurement | All Treasury Representatives | 02 hour | | | Local | |

| Name of the program | No. of Staff trained | Duration of the Program | Total Investment (Rs.) | | Nature of the Program ( Foreign/ Local ) | Output/ Knowledge gained |
|---|---|---|---|---|---|---|
| | | | Local | Foreign | | |
| Training Program on Sri Lanka Public Sector Accounting Standards | Ms. S. Hettiarachchi /Director Ms. D. Gamage/ Director | 4 days | Free | | Local | |
| Seminar for Safe, Scientific & Economical Driving 1 day program | Mr. S.A.R. Priyantha/ Driver | 1 day | 5000 | | Local | |
| Training Programme on Economics & Development , Administration and impactful Growth St strategies | Mr. M.M. Noufal/ ADG, Ms. A.D.A.K. Nandasena/ Director, Ms. V.I. Dilhani/ Director | 4 days | Free | | Local | |
| Work shop on preparation of Salaries of government Servant | Ms. A.S. Lakshmi / MA | 1 day | 5000 | | Local | |
| Certificate course in Procurement Process | Ms. W. M. Perera/AD | 10 days | 25,000 | | Local | |
| Workshop on Understanding the human Mind | M.M. Noufal/ ADG | 2 days | Free | | Local | |
| Computer Hardware with Network | D. Shashika Saram/ MSO | 6$^{th}$ months | 34,350 | | Local | |
| Workshop on Business Writing | Ms. Kavitha Srisudaron/ DO | 2 days | Free | | Local | |
| Land Administration for Public Sector Junior and Middle level Executive | Ms. D.N.K.H. Hettiarachchi /DD | 5 days | Free | | Local | |
| Workshop on " Value for Money " under " SLIDA Cross Sector Leaders" Program | Ms. W.A Wimalajeewa/ Director | 1 day | Free | | Local | |

| Name of the program | No. of Staff trained | Duration of the Program | Total Investment (Rs.) | | Nature of the Program ( Foreign/ Local ) | Output/ Knowledge gained |
|---|---|---|---|---|---|---|
| | | | Local | Foreign | | |
| Training on Public-Private Partnerships in Sri Lanka | Ms. W.H.A. Wimalajeewa/D, Ms. H.D.N.K. Hettiarachchi /D | 1 day | Free | | Local | |
| IMF/WB mission on Establishment of Debt Management Agency in the MOF | Ms. A.D.A.K. Nandasena/ D, and Ms. S.G. Pathirage/D | 1 day | Free | | | |
| Preliminary Investigation Training | Ms. J.M.S.W.Jayasinghe | 2 days | 9,500 | | Local | |
| Training program on New Audit Act and Resolving Audit Issues | Ms. W.M. Perera/ AD | 1 day | 6,000 | | | |
| Seminar on Economic Transformation and Supporting Sustainable Economic Growth- Sharing the experience of Czech Republic | Ms. Champa Balasooriya/ D, Ms. A.D.A.K. Nandasena/ D, Ms. S.G. Pathirage | 2 days | Free | | Local | |
| Training on Workshop of Tax Implications for 2023 & 2024 | Ms.J.T.C. Krishanthi/MA | 1 day | 6000 | | Local | |
| Follow –up workshop by Commercial Law Development Program(CDDP), U.S. Department of Commerce from11th to 13th 2023 at Taj Samudram | Ms. A.D.D. Tharaka/ AD | 1 day | Free | | Local | |
| Training program on Staff Motivation | All Officers of PFD | 8 hours | Free | | Local | |

| Name of the program | No. of Staff trained | Duration of the Program | Total Investment (Rs.) | Nature of the Program ( Foreign/ Local ) | Output/ Knowledge gained |
|---|---|---|---|---|---|
| e- GP Awareness Training Session | All officers of PFD | 2 Days | | Local | |
| Effective Management of Public Investment | Ms. P.W.S. Amarasena/DO | 5 days | | Foreign | |
| Macroeconomics of Climate Change, India | Ms. H.D.N.K. Hettiarachchi/ DD | 11 days | | Foreign | |
| Bilateral Seminar on Cross- Border E- Commerce | Ms. L.N.A.K.N. Nishshanka/ | 14 days | | Foreign | |
| ADB: 9th Conference of the Asia Pacific Public Electronic Procurement Network | Mr. E.A. Rathnaseela/ DG | 3 days | | Foreign | |
| ADB: 9th Conference of the Asia Pacific Public Electronic Procurement Network | Mr. Ajantha Galhena/ADG | 3 days | | Foreign | |
| Seminar on China's Foreign Aid Projects of Complete Sets of Equipment- AIBO | Mrs. J.M.S.W. Jayasinghe/Do | 14 days | | Foreign | |
| Seminar on Bank Regulation and Financial Risk Prevention for Developing Countries | Ms. Deepthi Parakrama Karunarathna/ DD | 14 days | | Foreign | |
| Seminar on Bank Regulation and Financial Risk Prevention for Developing Countries | Ms. Subani Maduwanthi/ DD | 14 days | | Foreign | |
| Advanced Seminar for Financial Leaders from the Perspective of the Belt and Road Initiative | Mr. J.M.U.P. Jayamaha | 7 days | | Foreign | |

***ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද** යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

කාර්ය මණ්ඩලයේ දැනුම සහ ධාරිතා සංවර්ධනය මෙන්ම සේවක අභිප්‍රේරණය සඳහා දේශිය මෙන්ම විදේශිය පුහුණු වැඩසටහන් මහත් පිටිවහලක් වේ. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට සෘජු සම්බන්ධ විෂයානුබද්ධ මෙන්ම රාජ්‍ය සේවයට පොදු කරුණු සම්බන්ධයෙන් ලබන්නාවූ පුහුණුව සහ අත්දැකීම් දෙපාර්තමේන්තුවේ කාර්යය සාධනය කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කරනු ලබයි.

**07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව**

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාළ නොවේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අදාළ නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අදාල නොවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අදාළ නොවේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාළ නොවේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාළ නොවේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.3 | 20.09.2017 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | _ | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |